**ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව**
**රත්නපුර දිස්ත්‍රික්කය**
**-------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 18 දින සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
-----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2017 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු රු. 95,168 ක් ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාළ ස්ථාවර තැන්පතු පොළිය රු. 108,438 ක් වුවත් එය රු. 70,688 ක් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් පොළී ආදායම රු. 37,750 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල මිලදී ගෙන තිබුණු රු. 171,803 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබීම හේතුවෙන් ස්ථාවර වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දැක්වුණි.

(ඈ) ස්ථාවර වත්කම් මිලදී ගැනීම වෙනුවෙන් වැයකර තිබුණු රු. 158,294 ක් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගතකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් වියදම සමාන වටිනාකමකින් වැඩියෙන් දැක්වුණි.

(ඉ) සමාලෝචිත වර්ෂය තුල ආපසු ගෙවන ලද ටෙන්ඩර් ඇප තැන්පතු රු. 77,630 ක් ගිණුම්ගතකර නොතිබීම හේතුවෙන් ඇප තැන්පත් ගිණුමේ ශේෂය සමාන වටිනාකමකින් වැඩියෙන් දැක්වුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාළ තථ්‍ය උසාවි දඩ හා මුද්දර ගාස්තු ආදායම හඳුනාගැනීමකින් තොරව පිලිවෙලින් රු. 9,000,000 ක් හා රු. 10,000,000 ක් වූ ඇස්තමේන්තුගත වටිනාකම් ගිණුම්ගත කර තිබුණි.

#### 1.3.2 නොසැසඳුණු ගිණුම්
-----------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) ගිණුම් විෂයයන් 06 කට අදාලව සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු. 1,281,725 ක වෙනසක් විය.

(ආ) ගිණුම් විෂයයන් 02 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන් සහ ඊට අදාල සටහන් වල දැක්වෙන ශේෂයන් අතර රු. 137,764,456 ක වෙනසක් පැවතුණි.

### 1.3.3 අනුකූල නොවීම්

**නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (අ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 204 වන රීතිය | 19,320 | 2016 වර්ෂයට අදාල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවේ සඳහන් විෂයයන් 16 ක හා වටිනාකම හඳුනාගෙන නොතිබූ විෂයයන් 05 ක ඌනතාවය සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 371(2)(ඇ) | 1,326,035 | 1995 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල අවස්ථා 57 ක දී ලබා දී තිබුණු අත්තිකාරම් පියවා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1988 අගෝස්තු 23 දිනැති අංක 520/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ IV (ආ) කොටසේ 5(5) වන අතුරු ව්‍යවස්ථාව | | සමාලෝචිත වර්ෂය තුල හඳුනාගෙන තිබූ අනවසර ඉදිකිරීම් 35 ක් ඉවත් කරගන්නා ලෙසට හෝ නීත්‍යානුකූල කර ගන්නා ලෙසට ලිඛිත දැනුම් දීම් සිදුකර තිබුණද, ඒ සඳහා කිසිඳු ප්‍රතිචාරයක් ලැබී නොතිබුණු බැවින් අදාල ඉදිකිරීම් ඉවත් කිරීමට සභාව පියවර ගෙන නොතිබුණි. |
| (ඈ) | 2009 මාර්තු 09 දිනැති අංක 2009/01 දරන පළාත් පාලන චක්‍රලේඛයේ 1.10 ඡේදය | 102,035 | ඇහැලියගොඩ බස් නැවතුම්පල පිහිටි කඩකාමරයක් 2007 වර්ෂයේ සිට අතුරු බදුදී තිබීම හේතුවෙන් අතුරු බදුකරු නීත්‍යානුකූල කර හිඟ කඩකුලිය අයකර ගැනීම සඳහා ප්‍රධාන අමාත්‍යවරයා විසින් අනුමැතිය ලබාදී තිබුණ ද, එපරිදි කටයුතු කර නොතිබුණු අතර හිඟ කඩකුලියද අයකර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 15,589,017 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 12,823,818 ක් විය.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 8,477,000 | 9,023,814 | 8,573,527 | 13,490,044 | 6,688,000 | 9,038,963 | 7,315,517 | 12,779,273 |
| කුලී | 6,738,900 | 7,033,416 | 7,216,722 | 685,781 | 4,364,800 | 5,944,926 | 6,484,031 | 879,597 |
| බලපත්‍ර ගාස්තු | 881,650 | 1,035,707 | 1,007,807 | 91,000 | 777,000 | 804,452 | 822,444 | 17,550 |
| වෙනත් ආදායම් | 23,638,500 | 22,981,403 | 33,438,251 | 20,002,855 | 16,242,850 | 16,758,442 | 12,731,148 | 17,344,982 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම, රැස්කල ආදායම සමඟ සැසඳීමේදී වරිපනම් හා බදු, බදු කුලී, බලපත්‍ර ගාස්තු හා වෙනත් ආදායම් යන ආදායම් විෂයයන්ගෙන් රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 01, සියයට 07, සියයට 14 හා සියයට 96 කින් වැඩි වී තිබූ අතර සේවා සඳහා ගාස්තු, වරෙන්තු හා දඩ හා රජයේ දායකත්වය යන ආදායම් විෂයයන්ගේ රැස්කල ආදායම අයවැයගත ප්‍රමාණයට වඩා පිළිවෙලින් සියයට 36, සියයට 26 හා සියයට 02 කින් අඩුවී තිබුණි.

**2.2.3 වරිපනම් හා බදු**

**(අ) වරිපනම්**

2017 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් ශේෂය රු. 13,117,151 ක් වූ අතර, ඒ තුල වර්ෂ 05 ට වඩා වැඩි කාල සීමාවක සිට පැවත එන ඒකක 960 කින් අයවිය යුතු රු. 6,755,238 ක් පැවතුණි. හිඟ මුදල් අයකර ගැනීම සම්බන්ධයෙන් සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි.

**(ආ) අක්කර බදු**

2017 දෙසැම්බර් 31 දිනට හිඟ අක්කර බදු ශේෂය රු. 185,630 ක් වූ අතර, ඒ තුල වර්ෂ 05 ට වඩා වැඩි කාලයක සිට පැවත එන ඒකක 121 කින් අයවිය යුතු එකතුව රු. 158,438 ක් පැවතුණි. හිඟ මුදල් අයකර ගැනීම සඳහා සභාවේ ක්‍රියාකාරීත්වය දුර්වල මට්ටමක පැවතුණි.

### 2.2.4 කුලී

-----

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් ඇහැලියගොඩ එළමස් හා කුකුල් මස් වෙළඳසැල් වලින් 2013 හා 2015 වර්ෂ වලට අදාලව අයවිය යුතු රු. 352,209 ක කඩකුලී අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබූ අතර, නිසි පරිදි ගිවිසුම්ගත වී නොතිබීම හිඟ කුලී අයකර ගැනීමට බාධාවක් වී තිබුණි.

(ආ) ඇහැලියගොඩ සතිපොල වෙනුවෙන් 2012 වර්ෂයේදී අයවිය යුතුව තිබූ රු. 252,909 ක හිඟ බදුකුලී සම්බන්ධයෙන් අවිස්සාවේල්ල දිසා අධිකරණයෙන් ලබා දී තිබූ නඩු තීන්දුව ප්‍රකාරව බදුකරු මුදල් ගෙවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසන් වනවිට රු. 180,000 ක් අයවිය යුතුව පැවතුණි.

### 2.2.5 බලපත්‍ර ගාස්තු

--------------

1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව 2016 හා 2017 වර්ෂ වල බලපත්‍ර අළුත් කලයුතු ව්‍යාපාරික ස්ථාන 03 ක්, පරිසර ආරක්ෂණ බලපත්‍ර අළුත් නොකිරීම හේතුවෙන් සභාවට රු. 13,200 ක ආදායමක් අහිමි වී තිබුණු අතර, එම ව්‍යාපාර පවත්වාගෙන යාමේදී සිදුවිය හැකි පාරිසරික බලපෑම පිළිබඳ කාලීන ඇගයීමක් සිදුකර නොතිබුණි.

### 2.2.6 වෙනත් ආදායම්

------------------

සභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු 06 ක් සඳහා අයවිය යුතු රු.76,750 ක් අයකර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි.

### 2.2.7 උසාවි දඩ හා මුද්දර ගාස්තු

----------------------------

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2016 ජනවාරි සිට 2017 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු එකතුව රු. 10,223,983 ක උසාවි දඩ මුදල් අයකර ගැනීමට 2018 මාර්තු වනවිටත් අපොහොසත් වී තිබුණි.

(ආ) 2016 ජූලි සිට 2017 දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදයට අදාලව අයවිය යුතු මුද්දර බදු ආදායම හඳුනාගෙන අයකර ගැනීමට 2018 මාර්තු වනවිටත් අපොහොසත් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 කාර්යසාධනය

----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුඛසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

**(අ) ක්‍රියාකාරී සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**(ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

පහත කරුණු නිරීක්ෂණය විය.

(i) සභාව විසින් බේරුවානවත්ත කසළ බැහැර කරන ස්ථානයේ හා කොහිලදෙණිය ප්‍රදේශයේ නොදිරන කසළ රැස්කිරීම හා කොම්පෝස්ට් සකස් කිරීම අරමුණ කරගනිමින් මධ්‍යස්ථාන 02 ක් ඉදිකර තිබුණි. කොම්පෝස්ට් නිෂ්පාදනය 2016 වර්ෂයේ මුල සිට නතර කර තිබීමත්, නොදිරන හා දිරන කසළ වෙන් වෙන්ව රැස්කිරීමක් සිදුනොවීමත් හේතුවෙන් රු. 6,180,880 ක් වැයකර ඉදිකර තිබූ මධ්‍යස්ථාන දෙක හා කොම්පෝස්ට් නිෂ්පාදන යන්ත්‍ර දෙක සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් නිෂ්කාර්යයව පැවතුණි.

(ii) සභාව විසින් රැස් කරන දිරන හා නොදිරන කසළ බේරුවාන ප්‍රදේශයේ අක්කරයක පමණ විවෘත භූමියකට අවිධිමත්ව බැහැර කිරීම හේතුවෙන් දැඩි පාරිසරික හානියක් සිදුව තිබුණි.

(iii) 2014 වර්ෂයේදී රු. 1,805,340 ක් වැයකර සභා නියෝජිතයින් වෙත අපද්‍රව්‍ය කළමනාකරණය සම්බන්ධයෙන් විදේශ පුහුණුවක් ලබාදී තිබුණද, එම පුහුණුවෙන් පසු සභා බල ප්‍රදේශයේ කසළ කළමනාකරණයෙහි ගුණාත්මක සංවර්ධනයක් සිදුවී නොතිබීම හේතුවෙන් දරන ලද වැය නිෂ්ඵල වී තිබුණි.

(iv) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126(ix) (ආ) වගන්තිය ප්‍රකාරව මලාපවහනය සහ කසළ ශෝධනය හා ඒ සඳහා ගාස්තු අයකිරීම, අතුරු ව්‍යවස්ථා වලට විෂයය වන කරුණක් වශයෙන් දක්වා තිබුණද, කසළ ශෝධනය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා පනවාගෙන ක්‍රියාත්මක කිරීමට සභාව අපොහොසත් වී තිබුණි.

**(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක**

තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධයෙන් වූ 2030 න්‍යාය පත්‍රය පිළිබඳව සභාව දැනුවත්ව නොසිටීම හේතුවෙන් එම අරමුණු සඳහා වන ගෝලීය දර්ශක තුළින් සභා බල ප්‍රදේශයේ මහජනතාවගේ ජීවන තත්ත්වය සහ සෞඛ්‍ය නංවාලීම සඳහා වන දිගුකාලීන සැලසුම් 2018 මැයි වනවිටත් සකස් කර නොතිබුණි.

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**සේවක ණය**

අයවීම් හිඟහිට තිබුණු එකතුව රු. 56,054 ක් වූ සේවක ණය ශේෂ අයකර ගැනීමට අපොහොසත් වී තිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

2015 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය තුල සභා බල ප්‍රදේශයේ සිදුකර තිබූ ඉඩම් වෙන්දේසි 07 කදී ඉඩම් වල විකුණුම් වටිනාකම පිළිබඳව වූ තාවකාලික තක්සේරුව මත පදනම්ව සියයට 1 සමාන වූ එකතුව රු. 762,920 ක් පමණක් සභාව වෙත අයකර ගෙන තිබුණි. 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154(1) උප වගන්තිය ප්‍රකාරව ඉඩම් විකිණීමෙන් ලත් මුදලින් සියයට 1

කට සමාන බද්දක් ප්‍රාදේශීය සභාව වෙත අයවිය යුතු වුවත්, එම වටිනාකම හඳුනාගෙන අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 වත්කම් වල ආරක්ෂාව තහවුරු නොකිරීම

දිවුරුම්පිටිය නරියාමුල්ලහේන ඉඩම් වෙන්දේසියේදී පොදු කටයුතු සඳහා සභාව වෙත පවරා දී තිබූ පර්චස් 25 ක ඉඩම් කොටස වටා ආරක්ෂිත වැටක් ඉදිකර සභාව සතු ඉඩමක් යන්න නම් කර නොතිබුණු අතර, භූමිය වල් බිහි වී තිබුණි. සභාව සතු වත්කම් ආරක්ෂා කිරීම හා අරමුණුගත කාර්යයන් සඳහා යෙදවීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් අවධානයක් යොමුකර නොතිබුණි.

#### 3.4.2 පවරා නොගත් වත්කම්

දිවුරුම්පිටිය නරියාමුල්ලහේන ඉඩම් වෙන්දේසියේදී පොදු කටයුතු සඳහා වෙන් කල යුතු සියයට 10 ක භූමි ප්‍රමාණයෙන් පර්චස් 22.61 ක් අඩුවෙන් සභාවට පවරා දී තිබුණි. නියමිත භූමි ප්‍රමාණය පවරා ගැනීමට හෝ එහි වටිනාකම සභාව වෙත අයකර ගැනීමට 2018 මාර්තු වනවිටත් සභාව අපොහොසත් වී තිබුණි.

### 3.5 ප්‍රසම්පාදනය

#### 3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් සභාව විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

#### 3.5.2 සැපයීම් හා සේවා

සමාලෝචිත වර්ෂය තුල ඩිජිටල් ඡායාපිටපත් යන්ත්‍රයක්, ලැප්ටොප් පරිගණක 02 ක් හා ඩෙස්ක්ටොප් පරිගණක 04 ක් මිලදී ගෙන තිබූ අතර, එම භාණ්ඩ මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.1 (ආ) මාර්ගෝපදේශය ප්‍රකාරව නියමිත පිරිවිතර වලට අනුකූල බවට වූ තාක්ෂණික ඇගයීම් කමිටු නිර්දේශයකින් තොරව පෞද්ගලික ආයතනයක් වෙත රු. 535,000 ක් ගෙවීම් කර තිබුණි.

## 4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

වැය විෂයයන් 09 ක් සඳහා සලසා තිබුණු රු. 699,500 ක් වූ මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

### 4.2 අභ්‍යන්තර විගණනය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය වෙනුවෙන් සභාව සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 4.3 විගණන හා කළමනාකරණ කමිටු

විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීම සඳහා පියවර ගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළයුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) | වියදම් හඳුනා නොගැනීම |
| | | (ii) | ආදායම් අඩුවෙන් සටහන් කිරීම |
| | | (iii) | ලෙජර් ගිණුම් හා උපයෝගී ලේඛන නොසැසඳීම |
| | | (iv) | මූල්‍ය ප්‍රකාශන හා ඊට අදාල සටහන් නොසැසඳීම |
| (ආ) | ආදායම් පරිපාලනය | | නියමිත ආදායම අයකර නොගැනීම |
| (ඇ) | සන අපද්‍රව්‍ය කළමනාකරණය | | විධිමත් ලෙස බැහැර නොකිරීම |
| (ඈ) | වත්කම් උපයෝජනය | | නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම් පැවතීම |
| (ඉ) | අයවැය පාලනය | | ප්‍රතිපාදන ඉතිරිවීම |